
# ONE MORE CHANCE! අනේ! තව එක සැරයක්!





Its another morning, I have to go to office. I saw today's newspaper.

Oh! This is me. I shouted having a glance on my snap in todays newspapers What the hell it is doing in the Death Column ?

One sec….Let me think…

When I was going to bed-last night, I had a severe pain in my chest. I was taken to hospital, but I think I had sound sleep there.

It 's 10 am now. Where is my coffee? I will be late for office…My boss will get a chance to irritate me.

But where is everyone ? I think there is a crowd outside my room. But why some of them crying?

I looked inside the room….I was lying on the floor…...I was shocked. "Hey! Listen….! I am here…." I shouted.

Nobody was looking at me… They were watching my body lying on the floor. Am I dead….? I asked myself. Where is my wife…? My little daughter….? and my Friends? Where are they?

I saw my wife in the next room….She was crying….She was looking very sad…

My little kid was also crying because her mom was sad.

How can I go without saying my wife that she was the most beautiful and caring wife in this world.

How can I go without saying my child that I really love her. I really care for her.

How can I go without saying my friends that without them perhaps, I have done most of the wrong things in my life.

Oh ! the guy there was used to be my best friend. Small misunderstanding made us apart ….I just want to say him 'sorry….'

It seems no one is able to see me….Am I really dead ? I asked myself. Then I sat down near me. I was also feeling like crying.

I prayed. " Please God give me few more days. I want to make my wife, my kids, my friends realise that how much I love them."

I saw my wife entered the room. I wanted to tell her that ….to the world you might be one person…but to one person you might be the world….

" Oh! God….!" I screamed….. " Little more time please! One more chance to hug my little daughter... One more chance to thank my wife for still being there in my life…" I shouted….." God one more chance please…..! "

" You shouted in sleep…" my wife said…" Did you have a nightmare….? "

Oh thank God it was a just a dream. I was sleeping.

I hugged her and whispered.. " You are the most beautiful and caring wife in this universe.... I really love you…."

I prayed. " Thank you God for this second chance….."

**එ**ය තවත් උදෑසනකි. මා කාර්යාලයට යා යුතුය. අද උදේ පුවත් පත මා ඉදිරි යේ වෙයි. මම ඒ විවෘත පිටුව දෙස බැලීමි. එහි මගේ පින්තූරය මරණ දැන්වීම් තීරයේ පළවී තිබුණි. මොනවා ? මගේ පින්තූරය මරණ තීරුවේ දාලා? කාගෙ හරි විහිළුවක් ද ?

හෝව්...! හෝව්....! පොඩ්ඩක් ඉන්න කල්පනා කරන කල් !

ඊයේ රෑයේ මා නින්දට යන විට මගේ පපුවේ විශාල වේදනාවක් දැනෙනු මට මතකය. මා රෝහලට ගෙන යනවාද මතකය. එහිදී මට තදින් නින්ද ගියා වෙන්නට පුළුවන.

දැන් වෙලාව හරියටම උදේ10 යි....... කෝ මගේ උදේ කෝපි එක......? ඔපිස් එකට යන්නට අද නම් පරක්කු වෙයි....... එවිට අපේ ලොක්කාට සුපුරුදු ලෙස මගේ ඇහට කඩා පනින්නට අවස්ථාවක් එනවා ඇත.

ඒත් කෝ මේ අනික් අය.... ?

මා ඉන්නා කාමරයෙන් පිටත පිරිසක් සිටින බව හැඟේ. ඒ සමහර අය අඬනවාද ඇසේ. ඒ ඇයි ? මම මා සිටින කාමරය අවට විපරමින් බැලීමි. මා ඉන්නේ බිම දිගාකරලා ය.

ඒයි... ඒයි.... මේ අහන්න... මං මෙහේ... මම කීවෙමි.

එහෙත් කිසිවෙක් මා දෙස හැරී නොබලති. ඔවුන් බලා සිටින්නේ බිම වැතිරී ඇති මගේ සිරුර දෙසය. ඇත්තටම මා මියගොස්ද? මම මගෙන් ම ඇසුවෙමි. මගේ බිරිඳ, මගේ දරුවා, මගේ යහලුවන්.... මේ අය කෝ ?

මම යාබද කාමරයේ හිඳගෙන සිටින මගේ බිරිඳ දුටුවෙමි. ඇය හඬමින් සිටි යාය. මගේ දියණියද හඬයි. ඒ තම මව දුකෙන් සිටිනු ඇය දුටු නිසා ය.

මගේ බිරිඳට ඇය මෙලොව සිටින ඉතාම සුරූපී, ගුණ යහපත් බිරිඳ බව නොකියා මා කෙසේ නම් යන්නද?

මගේ දියණියට මා ඉතාම ආදරේ බව නොකියා මට යා හැකි ද?

මගේ ආදරණීය මිතුරන්ට ඔවුන් මට හමුවූ හොඳම කළණ මිතුරන් බව නොකියා කෙසේ නම් යන්න ද?

අර එහායින් ඉන්නේ මගේ හොඳම මිතුරාය. මේ ළඟදි ඉතා සුළු දේකට අපි අමනාප වූයෙමු. ඔහු ළඟට ගොස් දෑතින් අල්ලා ගෙන " අනේ සොරි මචං" යයි කියන්නට මට සිතුනි.

මෙතන ඉන්නා කිසිවෙකුට මා සිටිනා බවක් නොපෙනෙන බව මට දැන් පසක් වේ. ඇත්තටම මා මිය ගිහිල්ලාද? මම මගේ සිරුර ළඟ බිම හිඳගතිමි. සැබැවින්ම මට කෑගසා හඬන්නට සිතිණ. මම දන්නා සියළු දෙවිවරුන්ට කන්නලව් කළෙමි.


" අනේ දෙවියනේ මට තව එකම එක චාන්ස් එකක් දෙන්න... තව දවස් කීපයක් දෙන්න,... මට මගේ දුවට, බිරිඳට, යාළුවන්ට කතාකරන්න ඕන..... මට කියන්න බැරි වෙච්ච දේවල් හුඟක් තියනවා..... ඒ අය මට කොච්චර වටිනවද කියලා කියන්නෙ නැතුව මං කොහොමද යන්නෙ...? මට මගේ සිඟිති දුව තව එක සැරයක් වඩාගන්න ඕන..... මට මගේ බිරිඳ තව වරක් සිපගෙන මම ඇයට ගොඩාක් ආදරේ බව කියන්න ඕන.... මගේ යාළුවන්ගෙ කර වටා අත දමා ' මචං මං උඹලට හරි හිතවත් ' කියලා කියන්න ඕන.... එහෙම නැතුව මට යන්න බෑ.... ඒ කිසි දෙයක් මට හරි හැටි මෙපමණ කලක් කියාගන්න බැරි වුණා.... අනේ දෙවියනේ මට තව එකම එක චාන්ස් එකක් දෙන්න...."

මම මහා හඬින් හඬා වැටෙමින් දෙවිවරුන්ට කන්නලව් කළෙමි

" ඔයා නින්දෙන් මහ හයියෙන් කෑ ගැහුවා.... නපුරු හීනයක් දැක්කද....? " මගේ බිරිඳ මා සොලවමින් ඇසුවාය.

අනේ වාසනාවන්....! මම මටම සිතෙන් කියා ගතිමි. වචනයෙන් කිව නොහැකි සහනයක් මට දැනිණ. මා ඒ දැක ඇත්තේ හීනයකි.

♦ දීපා සඳමාලි හේරත්
**Deepa Sandamali Herath**



## Kubinsomu long lived 111 years


Ignacio Kubille Banos, the former sugar factory worker in Havana, Cuba, yesterday celebrated **111** years. He has 11 children, 40 grandchildren and 15 great-grandchildren.

ඉග්නේෂියෝ කුබිලේ හෙවත් කුබින් සෝමු කියුබාවේ හවානා නගරයේ ජීවත් වෙයි. ඔහු එහි පැරණි සීනි කම්හල් සේවකයෙකි. ගිය මස ඔහු සිය **111** වන උපන්දිනය සැමරීය

## පොතක් පතක්

## ලාල් හැගොඩගේ නවතම කාව්‍ය සංග්‍රහය

# මෙකව මෙතැනින් නවතමි






**ශ්‍රී**ලංකාවේ සම්භාවනීය ඡායාරූප ශිල්පියෙකු හා සම්මානනීය කවියෙකු ලෙස ප්‍රකටව සිටින ලාල් හැගොඩ කිවියරුන්ගේ නව තම කාව්‍ය නිර්මාණය වන **මෙ කව මෙතැනින් නවතමි** අපට කියවන්නට ලැබිණ. ඔහු ශ්‍රීලංකාවේ සම්ප්‍රදායික කවියන් අතර විශේෂ කවියෙකු වශයෙන් කැපී පෙනෙන්නේ ඔහුගේ කවි බස හා ගෙනෙන උපමා රූපක හැම විටම නවතාවක් දනවන බැවිනි. සුලබ උපමා රූපක පසුපස දුවන කවීන්ගෙන් ඔහු වෙන්කොට හැම විටම හඳුනා ගත හැකිය. ඒ අනන්‍යතාව ඔහුගේ සියළුම නිර්මාණ වල පාහේ දක්නා ලැබේ. ඔහුගේ නම නැතිව ලියූ කවියක් හමුවුවද ඒ කවිය ලාල්ගේ කවියක් යයි හඳුනා ගත හැකි ලකුණු ඔහු ඒ වායේ ඉතිරිකර ඇත.

කවිය සාමාන්‍ය ජනතාව අතරින් පලා යන බවක් ඇතැම් විට පෙනෙන්නට තිබේ. කවිය ජනතාවගේ ආත්මය ලෙස සලකමින් තිබූ රටක එය කෙමෙන් ජනතාව අතරින් ඈත්වන සෙයක් ඇතැම් විටක දැනෙයි. මෙම තත්වය වඩාත් පැහැදිලි වන්නේ කවිපොත් මුද්‍රණයට පොත් ප්‍රකාශකයින් දක්වන මැළිකම තුළිනි. කවි එකතුවක් එළිදක්වන්නට මුදල් සොයාගන්නට කවියාටම සිදුවේ. කවි පොත් මිළට ගැන්මට උනන්දුවක් දක්වන පිරිස් ශ්‍රීලංකාවේ අඩුබව සොයා බැලූ කල බොහෝ අය කියනු මම අසා ඇත්තෙමි. නව කතාවට, පරිවර්තන කෘතිවලට අද අප රටේ ඇති තැන කවියට නොතිබීම අවාසනාවකි.

හැත්තෑවේ යුගයේ ලංකාවට හඳුන්වා දුන් විවෘත ආර්ථිකයත් සමග සාහිත්‍ය කලා ක්ෂෙත්‍රය විශාල පරිවර්තනයකට හසුවූ බව කිව හැකිය. මුලින් සිංහළ කවියට හිතැතිව සිටි බොහෝ දෙනා හැරුණේ ගීත රචනයටය. ගීත රචකයින් කවියන් ලෙස ගණන් ගැනෙන්ට වීය. කවියට වඩා ගීතය උසස් දෙයක් ලෙස සැලකෙන්-නට වීය. මෙයද කාව්‍ය ක්ෂෙත්‍රය පුරන්ව යාමට හේතු වී යයි සිතමි. කාව්‍ය රචනය ඉරිදා පුවත් පතක පිටු බාගයකට සීමා වුණි.

එහෙත් කවිය ජාතියක හද බස යනුවෙන් හඳුන්වා ඇත්තේ කොයි මොහොතක හෝ කවිය යළි පණගසා සාමාන්‍ය ජනයාගේ පිළිගැනීමට පැමිණිය හැකි බැවිනි. ලාල් හැගොඩගේ නිර්මාණ හා ඔහු කවියකින් කියන්නට යන හැම වදනක්ම අපේ ජනසමා-ජයේ දුක සතුට සන්තාපය කියන්නට ගන්නා වෑයමක් ලෙස පෙන්නා දීම සුදුසුය.

මෙකව මෙතැනින් නවතමි කාව්‍ය සංග්‍රහයේ එන සූර්ය දිව්‍යරාජයා නම් පැදිපෙළ එවැන්නකි.

| | |
|---|---|
| හාන්සි පුටුවක ඇලවී | විමන් හැරගොස් |
| සුරුට්ටුවක් උරමින් | ඇතියෙන් |
| මනස්තාපයෙන් | රෝහලේ දෙවිවරු |
| සූර්ය දිව්‍යරාජයා | වැඩවැරූ |
| වැඩ නිමාවී දවසේ | කිරි දරු කරපින්නා |
| නොසෝදා ඇහපත | හැරී ආ |
| නොනිදා කල්පනා කරමින් | දෑරූ වැට ඉනි |
| නංවයි අඳුරු වළා අහසේ | අම්මලා |

ලාල් හැගොඩ සිංහළ කවිකෙත පෝෂණය කරන්නට කාව්‍ය රචනා කිරීමෙන් ද කාව්‍ය සංග්‍රහයන් පළකිරීමෙන් ද පමණක් නොව අප රට පුරා විසිරී සිටින තරුණ කවිකිවිදියන්ගේ නිර්මාණ එකතු කොට ඒ සියල්ල **කවි සියපත** නම් කවි එකතුවක් තුළින් වසර ගණනාවක් එළිදැක්වීය. ඒ කාර්යයම කවියට ඔහුගේ ඇති ඇල්ම ප්‍රකට කරනවා පමණක් නොව කවි ලියන තරුණ පරම්පරාවේ අය තුළ කවියට ඇති ඇල්ම වර්ධනය කරනු වස් ගත් අගනා පියවරකි.

ඔහු කලින් පළකර ඇති **මා මිනිසෙක් ඔබ ගහක් නිසා** (1994) **පහළොස්වක සඳ මගේය** (1995) කාව්‍ය නිර්මාණ යන්ට රාජ්‍ය සම්මාන සහ සාහිත්‍ය සම්මාන හිමි වී ඇත. **මෙකව මෙතැනින් නවතමි** ලාල් හැගොඩගේ කාව්‍ය චින්තනයේ අග්‍ර ඵලය වශයෙන් හඳුන්වා දෙන්නට කැමැත්තෙමි.

♦ වෙනුර